ඩොයිෂ් බැංකුව

සමූහය
21 වෙනි මහල, OGF මන්දිරය, 1A මැද පාර, ගාලු මුවදොර, කොළඹ 2
දුරකථන : +94-11-2447062, ෆැක්ස් : +94-11-2447067

මූල්‍ය ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආයතනික පාලනය

කළමනාකරණ මණ්ඩලය

සමාගමේ යහපත සඳහා තිරසාර වටිනාකම නිර්මාණය කිරීමේ අරමුණින් ඩොයිෂ් කළමනාකරණ මණ්ඩලය නීතියට, එහි සාංගමික ව්‍යවස්ථාවලියට සහ කළමනාකරණ මණ්ඩලයේ යොමු නියමයන්ට අනුකූලව සමාගමේ කළමනාකරණය සඳහා වගකීම දරයි. එය කොටස් හිමියන්ගේ, සේවකයින්ගේ සහ අනෙකුත් සමාගම ආශ්‍රිත පාර්ශවකරුවන්ගේ යහපත සලකා බලයි. බැංකුවේ ව්‍යාපාර කළමනාකරණය සඳහා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් සාමූහිකව වගකිව යුතුය. කළමනාකරණ මණ්ඩලය, සමූහ කළමනාකරණ මණ්ඩලය ලෙස, සියලුම සමූහ සමාගම් මත සාමාන්‍ය පාලනය ක්‍රියාත්මක කරන ඒකාකාර මාර්ගෝපදේශවලට අනුකූලව ඩොයිෂ් බැංකු සමූහය කළමනාකරණය කරයි;

කළමනාකරණ මණ්ඩලය නීතිය සහ එහි සාංගමික ව්‍යවස්ථාවලිය මගින් නියම කර ඇති පරිදි සියලුම කාරණා තීරණය කරන අතර, නීතිමය අවශ්‍යතා සහ අභ්‍යන්තර මාර්ගෝපදේශ (අනුකූලතාව) වලට අනුකූලතාව සහතික කරයි. එමෙන්ම එය ප්‍රමාණවත් අභ්‍යන්තර මාර්ගෝපදේශ සංවර්ධනය කර ක්‍රියාත්මක කරන බව සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනී. කළමනාකරණ මණ්ඩලයේ වගකීම්වලට විශේෂයෙන්, බැංකුවේ උපායමාර්ගික කළමනාකරණය සහ දිශානතිය, සම්පත් වෙන්කිරීම, මූල්‍ය ගිණුම්කරණය සහ වාර්තාකරණය, පාලනය සහ අවදානම කළමනාකරණය, ව්‍යාපාර සංවිධානයේ විධිමත් ක්‍රියාකාරිත්වය, සමාගමේ මෙහෙයුම්වල පාරිසරික සහ සමাජීය බලපෑම් ක්‍රමානුකූලව හඳුනාගැනීම සහ තක්සේරු කිරීම මෙන්ම ආයතනික පාලනය ඇතුළත් වේ. කළමනාකරණ මණ්ඩලය විසින් කළමනාකරණ මණ්ඩලයට පහළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම සඳහා පත්කිරීම් සහ විශේෂයෙන්, ගෝලීය වශයෙන් ප්‍රධාන කාර්ය ඉටුකරන්නන් තීරණය කරයි. සමූහය තුළ කළමනාකරණ කාර්යයන්ට පුද්ගලයින් පත් කිරීමේදී, කළමනාකරණ මණ්ඩලය විවිධත්වය සැලකිල්ලට ගන්නා අතර, විශේෂයෙන් කාන්තාවන්ගේ සුදුසු නියෝජනය අත්කර ගැනීමට උත්සාහ දරයි. (වැඩිදුර තොරතුරු සඳහා මෙම ආයතනික පාලන ප්‍රකාශයේ "කළමනාකරණ තනතුරු/ස්ත්‍රීපුරුෂ කෝටාව තුළ කාන්තා කොටස සඳහා ඉලක්ක" කොටස බලන්න.

කළමනාකරණ මණ්ඩලය විශ්වාසය පිළිබඳ සහයෝගී සම්බන්ධතාවයකින් සහ සමාගමේ ප්‍රතිලාභය පිණිස අධීක්ෂණ මණ්ඩලය සමඟ සමීපව කටයුතු කරයි. කළමනාකරණ මණ්ඩලය විශේෂයෙන්, සමූහයට අදාළ උපායමාර්ගය, අපේක්ෂිත ව්‍යාපාර ප්‍රතිපත්තිය, සැලසුම්කිරීම, ව්‍යාපාර සංවර්ධනය, අවදානම් අවස්ථාව, අවදානම් කළමණාකරණය, සේවක සංවර්ධනය, කීර්තිනාමය සහ අනුකූලතාවයට අදාළ සියළුම සබඳතා සම්බන්ධයෙන් නීතිය සහ පරිපාලන මාර්ගෝපදේශ වලින් නියමකළ විෂයපථය තුළ අවමයකින් අධීක්ෂණ මණ්ඩලයට වාර්තා කරයි. අපගේ කළමනාකරණ මණ්ඩලයේ රාජකාරි, වගකීම් සහ ක්‍රියාපටිපාටි පිළිබඳ විස්තරාත්මක ඉදිරිපත් කිරීමක් එහි යොමු නියමයන්හි විශේෂයෙන් දක්වා ඇති අතර, එහි වර්තමාන පිටපත අපගේ වෙබ් අඩවියෙන් (www.db.com/ir/en/documents.htm) ලබාගත හැක.

අධීක්ෂණ මණ්ඩලය

ඩොයිෂ් බැංකුව ඒජී හි අධීක්ෂණ මණ්ඩලය කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් පත්කිරීම සහ ඉවත් කිරීම සිදුකරන අතර කළමනාකරණ මණ්ඩලය අධීක්ෂණය කර උපදෙස් ලබා දෙමින් බැංකුවට වැදගත්වන තීරණවලදී සෘජුවම සම්බන්ධ වේ. අධීක්ෂණය සහ උපදේශනයට විශේෂයෙන් තිරසාරතා ගැටළු ඇතුළත්ය. අධීක්ෂණ මණ්ඩලය විශ්වාසය පිළිබඳ සහයෝගී සම්බන්ධතාවයකින් සහ සමාගමේ ප්‍රතිලාභය පිණිස කළමනාකරණ මණ්ඩලය සමඟ සමීපව කටයුතු කරයි. අධීක්ෂණ මණ්ඩලය සහ එහි කමිටුවල අභ්‍යන්තර සංවිධානය මෙන්ම එහි සාමාජිකයින් සඳහා අවශ්‍යතා විශේෂ අධීක්ෂණ අවශ්‍යතාවන්ට යටත්වන අතර, එය තවදුරටත් ආයතනික පාලනය සම්බන්ධ ආයතනික නීති රෙගුලාසිවලට අනුපූරකයක් වේ. අනෙකුත් කරුණු අතර, එවැනි අවශ්‍යතා අපගේ විචක්ෂණ අධීක්ෂණ අධිකාරිය වැනි ජර්මන් බැංකුකරණ පනත (Kreditwesengesetz), ආයතන සඳහා පාරිශ්‍රමික ආඥාපනත, (Institutsvergütungsverordnung), යුරෝපීය බැංකුකරණ අධිකාරියේ මාර්ගෝපදේශ (EBA) සහ යුරෝපීය සුරැකුම්පත් සහ වෙළෙඳපොල අධිකාරි (ESMA) සහ යුරෝපීය මහ බැංකුවේ පරිපාලන ව්‍යාහාර සොයා ගනී. තනි පුද්ගල සිදුවීම්වලදී, ලැයිස්තුගත සමාගම් සඳහා ජර්මන් ආයතනික පාලන සංග්‍රහයේ (GCGC) නිර්දේශවලින් මේවා වෙනස් විය හැක. අධීක්ෂණ මණ්ඩල කමිටුවේ කාර්යය, රැස්වීම් සූදානම් කිරීම සහ පසු විපරම සඳහා මූලික මූලධර්ම, මෙන්ම එහි කමිටු ඇතුළුව අධීක්ෂණ මණ්ඩලයේ අභ්‍යන්තර ක්‍රියාපටිපාටි සඳහා පොදු නීති අධීක්ෂණ මණ්ඩලය සහ එහි කමිටුවල යොමු නියමයන් හි දක්වා ඇත. එහි වර්තමාන පිටපත ඩොයිෂ් බැංකුවේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කෙරේ. (www.db.com/ir/en/documents.htm). දුරකථනය මගින්, වීඩියෝ සම්මන්ත්‍රණ මගින් සහ කායික පැමිණීම මගින් මූල්‍ය වසර තුළ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව අධීක්ෂණ මණ්ඩල වාර්තාවේ දක්වා ඇත. ඊට අමතරම, සේවක නියෝජිතයින් සහ කොටස්හිමියන්ගේ නියෝජිතයන් විධිමත්ව මූලික සාකච්ඡා වෙන වෙනම පවත්වනු ලබයි.

අධීක්ෂණ මණ්ඩලය, කළමනාකරණය මණ්ඩලය සමඟ දිගුකාලීන අනුප්‍රාප්තික සැලැස්ම පිළියෙල කරයි. නාමයෝජනා කමිටුව සභාපතිගේ කමිටුවට සහයවන අතර, අධීක්ෂණ මණ්ඩලය බැංකුවේ කළමනාකරණ මණ්ඩලයේ තනතුරු පිරවීමට අපේක්ෂකයින් හඳුනා ගැනීමේදී සහය වේ. මෙසේ සිදුකරමින්, මෙම කමිටුව අපේක්ෂක විස්තරයක් සහිතව තනතුරු විස්තරයක් සකස් කරන අතර අපේක්ෂික කාල බැඳීම සටහන් කරයි. සමහර අවස්ථාවල, බාහිර බඳවා ගැනීමේ උපදේශකයින් සමඟ සහයෝගීත්වයෙන් සුදුසු අපේක්ෂකයින් හඳුනා ගන්නා අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබයි. බාහිර අපේක්ෂකයින් සහිත අනුප්‍රාප්තික සැලැස්ම හැර, කළමනාකරණය මණ්ඩලය සහ අධීක්ෂණ මණ්ඩලය අභ්‍යන්තර අපේක්ෂක ලැයිස්තුවක් ද පවත්වා ගනී. නාමයෝජනා කමිටුව සහ අධීක්ෂණ මණ්ඩලය වෙත කළමනාකරණ මණ්ඩලයේ දෘෂ්ටිකෝණයෙන් අනුප්‍රාප්තික සැලැස්ම සඳහා අභ්‍යන්තර අපේක්ෂකයින් සහ ක්‍රියාවලිය පිළිබඳ කළමනාකරණ මණ්ඩලයෙන් නිරන්තරව වාර්තා ලැබේ. සුදුසු බාහිර සහ අභ්‍යන්තර අපේක්ෂකයින් තෝරාගැනීම සඳහා, නාමයෝජනා කමිටුව කළමනාකරණ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ගේ දැනුම, කුසලතා සහ පළපුරුද්ද පිළිබඳ තුළනය සහ විවිධත්වය සැලකිල්ලට ගනී. නිදසුනක් ලෙස ස්ත්‍රීපුරුෂභාවය, ජාතිය සහ වයස සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලය මත විවිධත්වය පෝෂණය කිරීමට ද උත්සාහ දරයි. අධීක්ෂණ මණ්ඩලය කොටස් සංස්ථා පනතේ (AktG) 76 (3ඒ) වගන්තිය අනුව නීතියෙන් අවශ්‍ය අවම ස්ත්‍රීපුරුෂ සහභාගිත්වයට අනුකූලතාව සහතික කරයි. 2017 දී, කොටස් සංස්ථා පනතේ (AktG) 111(5) වගන්තිය යටතේ කාලයට අදාළ නීති රෙගුලාසිය මත පදනම් වී, අධීක්ෂණ මණ්ඩලය විසින් 2022 ජූනි 30 වන විට කළමනාකරණය මණ්ඩලය සම්බන්ධව 20%ක අවම කාන්තා ඉලක්කය නියම කර ඇත. ක්‍රිස්ටියානා රිලේ සහ රෙබෙකා ෂෝර්ට් කළමනාකරණ මණ්ඩලයේ කාන්තා සාමාජිකයින් දෙදෙනෙක් බැවින් මෙම ඉලක්කය සපුරන ලදී. නාමයෝජනා කමිටුවේ කටයුතු ගොඩ නගමින්, සභාපතිගේ කමිටුව අධීක්ෂණ මණ්ඩලයේ යෝජනාව සඳහා නිර්දේශයක් ඉදිරිපත් කරයි. මේ මත පදනම් වී, කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්ගේ පත් කිරීම පිළිබඳව අධීක්ෂණ මණ්ඩලය තීරණය කරයි. පළමු පත් කිරීම් කාලය වසර තුනක උපරිමයකි. කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් තනතුර සඳහා එක් වරක් හෝ කිහිප වරක් පත් කරනු ලැබිය හැකි අතර නීතියට අනුව එය උපරිම වසර පහක් විය යුතුය. ඒ තුළින් ඩොයිෂ් බැංකුවේ එවැනි පත් කිරීම් පොදුවේ උපරිම වසර තුනක් විය යුතුය. කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම සඳහා යෝජනා හැර, සභාපතිගේ කමිටුව ද අධීක්ෂණ මණ්ඩලය තීරණය කරන කළමනාකරණ මණ්ඩල සාමාජිකයින්ගේ ඉවත් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරයි.

පාරිශ්‍රමික පාලන කමිටුවේ යෝජනා මත පදනම් වී, අධීක්ෂණ මණ්ඩලය කළමනාකරණ මණ්ඩලයේ එක් එක් සාමාජිකයින්ගේ මුළු පාරිශ්‍රමිකය තීරණය කරන අතර කළමනාකරණ මණ්ඩලය සඳහා වන්දි ගෙවීම් ක්‍රමය පිළිබඳ නිරන්තරව සමාලෝචනය කර විසඳිම සිදු කරයි.

විශේෂයෙන්, සමූහයට අදාළ උපායමාර්ගය, අපේක්ෂිත ව්‍යාපාර ප්‍රතිපත්තිය, සැලසුම් කිරීම, ව්‍යාපාර සංවර්ධනය, අවදානම් අවස්ථාව, අවදානම් කළමණාකරණය, සේවක සංවර්ධනය, කීර්තිනාමය සහ අනුකූලතාවයට අදාළ සියළුම සබඳතා සම්බන්ධයෙන් නීතිය සහ පරිපාලන මාර්ගෝපදේශ වලින් නියමකළ විෂයපථය තුළ අවමයකින් අධීක්ෂණ මණ්ඩලය වෙත කළමනාකරණ මණ්ඩලයෙන් වාර්තා ලැබේ. තවද, සමූහයේ විගණනය හඳුනාගත් යම් විෂමතා නිරන්තරව විගණන කමිටුවට දැනුම් දෙන අතර බරපතල විෂමතා අවස්ථාවලදී - එය අනවශ්‍ය ප්‍රමාදයක් නොමැතිව දැනුම් දේ. ඒ අනුව කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ට අදාළව යම් බරපතල සොයාගැනීම් අධීක්ෂණ මණ්ඩලයේ සභාපති වෙත දැනුම් දේ. අධීක්ෂණ මණ්ඩලය සහ කළමනාකරණ මණ්ඩලය පොදු සහභාගිත්ව (අන්තර් ක්‍රියා) පෙරාතු ලේඛන සහ විශේෂිත සහභාගිත්ව (අන්තර් ක්‍රියා) පෙරාතු ලේඛණවල තොරතුරු පාලනයක් යොදා ගෙන ඇත. මේ මගින් අධීක්ෂණ මණ්ඩලය වාර්තාකරණය නියාමනය කිරීම පමණක් නොව අනෙකුත් කරුණු අතර, අධීක්ෂණ මණ්ඩලයේ විමසීම් සහ සමාගමේ සේවකයින්ගේ තොරතුරු සඳහා ඉල්ලීම් මෙන්ම රැස්වීම් සහ රැස්වීම් අතර සූදානම්වීම සම්බන්ධයෙන් තොරතුරු හුවමාරුව නියාමනය කරනු ලබයි.

අධීක්ෂණ මණ්ඩලයේ සභාපති අධීක්ෂණ මණ්ඩලයේ විධිමත් ක්‍රියාකාරිත්වය තුළ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර, මේ තුළ නායකත්ව කාර්යභාරයක් ඇත. අධීක්ෂණ මණ්ඩලයේ අභ්‍යන්තර සංවිධානය සහ සන්නිවේදන, අධීක්ෂණ මණ්ඩලය තුළ කටයුතුවල සම්බන්ධීකරණය සහ කළමනාකරණ මණ්ඩලය සමඟ අධීක්ෂණ මණ්ඩලයේ මැදිහත්වීම සම්බන්ධයෙන් අභ්‍යන්තර මාර්ගෝපදේශ නිකුත් කළ හැකිය. රැස්වීම් අතර, අධීක්ෂණ මණ්ඩලයේ සභාපති යෝග්‍ය පරිදි, අධීක්ෂණ මණ්ඩලයේ කමිටුවල සභාපතිවරුන් කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් සමඟ විශේෂයෙන් කළමනාකරණ මණ්ඩලයේ සභාපති සමඟ නිරන්තර සම්බන්ධතා පවත්වා ගන්නා අතර, ඔවුන් සමඟ අනෙකුත් කරුණු අතර, ඩොයිෂ් බැංකු සමූහයේ උපායමාර්ගික ගැටළු, සැලසුම් කිරීම, එහි ව්‍යාපාරවල සංවර්ධනය, අවදානම් අවස්ථාව, අවදානම් කළමනාකරණය, අවදානම් පාලනය, පාලනය, අනුකූලතාව, පාරිශ්‍රමික ක්‍රමය, තොරතුරු තාක්ෂණය, දත්ත සහ ඩිජිටල්කරණය මෙන්ම වැදගත් නීතිකරණ කටයුතු පිළිබඳව අදහස් හවුමාරු කර ගනී. අධීක්ෂණ මණ්ඩලයේ සභාපති සහ - ඔවුන්ට අදාළ ක්‍රියාත්මක වගකීම් තුළ - අධීක්ෂණ මණ්ඩලයේ කමිටුවල සභාපතිවරුන් වෙත අවස්ථාව තක්සේරු කිරීම, ඩොයිෂ් බැංකු සමූහයේ සංවර්ධනය සහ කළමනාකරණය සඳහා විශේෂයෙන් වැදගත් අවස්ථා සම්බන්ධයෙන් පිළිවෙලින් කළමනාකරණ මණ්ඩලයේ සභාපති විසින් හෝ අදාළ වගකිවයුතු කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයා විසින් ප්‍රමාදයක් නොමැතිව දැනුම් දීම සිදු කෙරේ. අධීක්ෂණ මණ්ඩලයේ සභාපති අවශ්‍ය අවස්ථාවලදී අධීක්ෂණ මණ්ඩලයට අදාළ මාතෘකා පිළිබඳ ආයෝජක සාකච්ඡාවල නියැලෙන අතර එවැනි සාකච්ඡාවල හරය පිළිබඳ අධීක්ෂණ මණ්ඩලය හිරතුරුව දැනුවත් කරයි. මේවා පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මාතෘකා ද ආවරණය කරයි. විගණන කමිටුවේ සභාපති තවදුරටත් රැස්වීම්වලින් පිටත විගණක සමඟ නිරන්තර සාකච්ඡා පවත්වයි.

ගනුදෙනු කිරීම සඳහා අධීක්ෂණ මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වන ව්‍යාපාර වර්ග ඩොයිෂ් බැංකුව ඒජී හි සාංගමික ව්‍යවස්ථාවලියේ විස්තර කර ඇත. තවද, අධීක්ෂණ මණ්ඩලයට සිය අනුමැතිය අවශ්‍යවන අතිරේක ගනුදෙනුද විස්තර කළ හැක. අධීක්ෂණ මණ්ඩලය කළමනාකරණ මණ්ඩලය නොමැතිව ද නිරන්තරව හමුවේ. නිසි සලකා බැලීමෙන් පසු සහ සුදුසු වන අවස්ථාවක, අධීක්ෂණ මණ්ඩලයට හෝ එහි කමිටුවලට ඔවුන්ගේ කාර්යය ඉටු කිරීම පිණිස, විගණකවරුන්, නීති උපදේශකයින් සහ වෙනත් අභ්‍යන්තර හෝ බාහිර උපදේශකයින්ගෙන් උපදෙස් ලබා ගත හැකිය. ඔවුන්ගේ කාර්යය ඉටු කිරීමේදී, අධීක්ෂණ මණ්ඩලයේ සභාපති කමිටුවල සභාපතිවරු සහ අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ට කළමනාකරණ මණ්ඩලයෙන් ස්වාධීන කළමනාකරණ මණ්ඩලයේ අධීක්ෂණ මණ්ඩල කාර්යාලය විසින් සහය ලබා දේ.

රැස්වීම් කිහිපයකදී, නාමයෝජනා කමිටුව සහ අධීක්ෂණ මණ්ඩලය අධීක්ෂණ මණ්ඩලයේ ඇගයීම ආමන්ත්‍රණය කරන අතර ජර්මන් බැංකු පනතේ :ණඋඨ* 25 වැනි වගන්තියට අනුව නීතිය මගින් නියම කළ පරිදි අවම වශයෙන් වාර්ෂිකව පැවැත්විය යුතු අතර ජර්මන් ආයතනික පාලන සංග්‍රහයේ (GCGC) ඇ 12 වගන්තියට අනුව එය අධීක්ෂණ මණ්ඩලයේ ස්වයං-ඇගයීමකි. ඇගයීම ස්ථිරව ක්‍රියාත්මක කිරීම සහ එහි කාලසටහන 2022 ජූලි 26 දින සහ 2022 ඔක්තෝබර් 25 දින නාමයෝජනා කමිටුවේ රැස්වීමේදී සාකච්ඡා කර තීරණය කෙරේ. බාහිර උපදේශකයෙකුගේ සේවාවන් මෙම සන්දර්භය තුළ අනිවාර්ය නැත. ඇගයීම ප්‍රධාන වශයෙන්ම අධීක්ෂණ මණ්ඩලයේ, අධීක්ෂණ මණ්ඩලයේ කමිටුවල සහ කළමනාකරණ මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් පුළුල් ප්‍රශ්නාවලියක් මත සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් සමඟ නාමයෝජනා කමිටුවේ සාමාජිකයින් විසින් පවත්වන ලද පුද්ගල සම්මුඛ සාකච්ඡා සහ කළමනාකරණ මණ්ඩලය සහ අධීක්ෂණ මණ්ඩලය යන දෙකෙහි තනි පුද්ගල සාමාජිකයින්ගේ ඇගයීම මත පදනම් වී සිදුකරන ලදී. අවසාන සකාච්ඡාව සහ ඇගයීමේ ප්‍රතිඵලය පිළිබඳ අනුමැතිය 2023 පෙබරවාරි 1 දින පැවති අධීක්ෂණ මණ්ඩල රැස්වීමේදී සිදු වූ අතර ප්‍රතිඵලය ලිඛිත අවසන් වාර්තාවේ දක්වා ඇත. අධීක්ෂණ මණ්ඩලය සහ කළමනාකරණ මණ්ඩලය විශේෂයෙන් වෘත්තීය සුදුසුකම්, පුද්ගල විශ්වාසය සහ කළමනාකරණ මණ්ඩලය සහ අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්ට ලබාගතහැකි කාලය සම්බන්ධයෙන් වෙන්කිරීම් නොමැති බවට ඉහළ සම්මතයක් අත්කර ගෙන ඇත යන මතයේ තවදුරටත් රැඳී සිටී.

අධීක්ෂණ මණ්ඩලයේ කමිටු

අධීක්ෂණ මණ්ඩලය පහත සඳහන් ස්ථාවර කමිටු අට ස්ථාපිත කර ඇත, ඒවානම්- සභාපතිගේ කමිටුව, නාමයෝජනා කමිටුව, විගණන කමිටුව, අවදානම් කමිටුව, නියාමන පාලන කමිටුව (මෙයට පරිපාලන කමිටුව) පාරිතෝෂික හා දීමනා පාලන කමිටුව, උපාය මාර්ග හා තිරසාර කමිටුව, (මෙයට පෙර උපාය මාර්ග කමිටුව) සහ තාක්ෂණ, දත්ත සහ නවෝත්පාදන කමිටුව වේ. අවශ්‍ය ප්‍රමාණයට, කමිටු ඔවුන්ගේ කටයුතු සම්බන්ධීකරණය කරන අතර ආවස්ථික පදනමක් මත එකිනෙකාගෙන් උපදෙස් ගනී. කමිටු සභාපතිවරුන් කමිටුවල වැඩ පිළිබඳ අධීක්ෂණ මණ්ඩලයට නිරන්තරයෙන් වාර්තා කරයි. ස්ථාවර කමිටුවල කාර්යය සහ වැඩිදුර විස්තර වෙනම යොමු නියමයන් තුළ නියාමනය කෙරේ. එහි වර්තමාන පිටපත ඩොයිෂ් බැංකුවේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. (www.db.com/ir/en/documents.htm).

සභාපතිගේ කමිටුව

කමිටුවේ සාමාජිකයින් වන්නේ ඇලෙක්සැන්ඩර් වයිනෙන්ඩ්ස්, සභාපති (2022 මැයි 19 සිට), ආචාර්ය පෝල් ඇත්ලෙයිට්බර් (2022 මැයි 19 දක්වා), ඩෙට්ලෙෆ් පොලස්චෙක්, ෆ්‍රෑන්ක් වෙර්නේක්, මහාචාර්ය වෛද්‍ය නෝර්බට් වින්කෙල්ජොහාන් ය.

සභාපතිගේ කමිටුව අධීක්ෂණ මණ්ඩලයේ රැස්වීම් සූදානම් කිරීම සඳහා සහ අධීක්ෂණ මණ්ඩලයේ රැස්වීම් අතර වර්තමාන ව්‍යාපාර මෙහෙයවීම, කළමනාකරණ මණ්ඩලය සඳහා දිගු කාලීන අනුප්‍රාප්තික සැලැස්ම ඇතුළුව කළමනාකරණ මණ්ඩලයේ පත්කිරීම සහ සේවයෙන් ඉවත් කිරීම පිළිබඳ අධීක්ෂණ මණ්ඩලයේ තීරණ සකස් කිරීම මෙන්ම නාමයෝජනා කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගැනීම, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ පාරිශ්‍රමිකය පිළිබඳ තීරණය කිරීමට අධීක්ෂණ මණ්ඩලයේ පූර්ණ තනි අධිකාරිය පිළිබඳ ප්‍රතිෂ්ඨාව තුළ රැකියා සහ විශ්‍රාම ගිවිසුම් අවසන් කිරීම, සංශෝධනය සහ අවසන් කිරීම, සහ පාරිතෝෂික හා දීමනා පාලන කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගැනීම, කළමනාකරණය මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස නම්කරන ඩොයිෂ් බැංකුව ඒජී හි (Generalbevollmächtigter) සාමාන්‍යධිකාරී සඳහා ගිවිසුම් සහ/හෝ ගිවිසුම්වලට සංශෝධන පිළිබඳ මතයක් අවශ්‍ය අවස්ථාවලදී ප්‍රකාශ කිරීම, කොටස් සංස්ථා පනතේ 12 වගන්තියට අනුව කළමනාකරණ මණ්ඩලයේ සක්‍රිය සහ හිටපු සාමාජිකයින් සමඟ වෙනත් ගිවිසුම්ගත ව්‍යාපාර මෙහෙයවීම, අභිනියෝග, ගරු තනතුරු හෝ ඩොයිෂ් බැංකු සමූහයේ කළමනාකරණ මණ්ඩලයෙන් පිටත විශේෂ කාර්යයන් අනුමැතිය, මෙන්ම නාමයෝජනා කමිටුවේ නිර්දේශ සැලකිල්ලට ගැනීම, කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරුන් සහ/හෝ ප්‍රධාන අවදානම් නිලධාරි සහ උපදේශකත්වයෙන් කළමනාකරණ මණ්ඩල සාමාජිකයෙක් අදාළ රහසිගත අභ්‍යන්තර දත්ත බැඳියා පිළිග වුම් ඇත්නම් මිස භාරදීම සඳහා අනුමැතිය, කොටස් සංස්ථා පනතේ 114 වගන්තියට අනුව අධීක්ෂණ මණ්ඩල සාමාජිකයින් සමඟ ගිවිසුම් අනුමැතිය, ආයතනික පාලන ක්ෂේත්‍රය තුළ අධීක්ෂණ මණ්ඩලයේ තීරණ සකස් කිරීම, අනුකූලතාවය ප්‍රකාශ කිරීමත් සමඟ වෙනස් වූ සැබෑ සැබෑ වාතාවරණය සහ සත්‍යාපනයට අනුකූලතාව පිළිබඳ වාර්ෂික ප්‍රකාශනය ගැලපීමක් මත අධීක්ෂණ මණ්ඩලයේ ස්ථානය තුළ තීරණ, අවශ්‍ය අවස්ථාවල විගණකවරුන්, ප්‍රවීනයින්, නෛතික සහ වෙනත් උපදේශකයින්ගේ උපදේශන සඳහා අධීක්ෂණ මණ්ඩලයේ සහ එහි කමිටුවල පිරිවැය පිළිබඳ අවශ්‍ය අවස්ථාවල මතයක් ප්‍රකාශ කිරීම, හානි සඳහා හිමිකම් ඉල්ලා සිටීම පිළිබඳ අධීක්ෂණ මණ්ඩලයේ තීරණ සඳහා නිර්දේශ සකස් කිරීම, හෝ කළමනාකරණ මණ්ඩලයේ නායකයින් සහ හිටපු සාමාජිකයින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සඳහා වගකීමට බැඳී සිටී. අවශ්‍ය පරිදි, නියාමන පාලන කමිටුවේ සභාපතිගේ ප්‍රවීනත්වය කමිටුව ලබා ගනි.

නාමයෝජනා කමිටුව

කමිටුවේ සාමාජිකයින් වන්නේ ඇලෙක්සැන්ඩර් වයිනෙන්ඩ්ස්, සභාපති, (2022 ජූලි 28), සාමාජික (2022 මැයි 19 සිට 2022 ජූලි 28 දක්වා) මේරි ක්ලාක්, සභාපති (2022 ජූලි 28) ආචාර්ය පෝල් ඇත්ලෙයිට්බර් (2022 මැයි 19 දක්වා), ඩෙට්ලෙෆ් පොලස්චෙක්, ෆ්‍රෑන්ක් වෙර්නේක්, මහාචාර්ය වෛද්‍ය නෝර්බට් වින්කෙල්ජොහාන් ය.

බැංකුවේ කළමනාකරණ මණ්ඩලයේ තනතුරක් පිරවීමට අපේක්ෂකයින් හඳුනා ගැනීම සඳහා නාමයෝජනා කමිටුව වගකීමට බැඳී සිටී. එසේ කරමින්, කමිටුව කළමනාකරණ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ගේ දැනුම, කුසලතා සහ පළපුරුද්ද පිළිබඳ තුළනය සහ විවිධත්වය සැලකිල්ලට ගනිමින් අපේක්ෂකයාගේ විස්තර සමඟ තනතුරු විස්තරයක් සකස් කර, කාර්යයට අදාළ කාල බැඳීම, කළමනාකරණ මණ්ඩලයේ අනුප්‍රාප්තික සැලැස්ම පිළිබඳ විශේෂ අවධානයක් සහිතව දක්ෂතා සංවර්ධනය සහ විවිධත්වය ප්‍රවර්ධනය, අධීක්ෂණ මණ්ඩලය මත අඩුවෙන් නියෝජනය වන ස්ත්‍රීපුරුෂභාවයේ නියෝජනය ප්‍රවර්ධනය කිරීමේ පර්මාර්ථයක් ඇති කිරීම මෙන්ම මෙය අත්කර ගැනීම සඳහා උපායමාර්ගයක් ලෙස, අධීක්ෂණ මණ්ඩලයේ කමිටුවලට පත්කිරීම් සඳහා යෝජනා සංවර්ධනය, ඩොයිස් බැංකුව ඒජී හි කළමනාකරණ මණ්ඩලයේ සහ අධීක්ෂණ මණ්ඩලයේ වෘත්තිය සුදුසුකම්, පුද්ගල විශ්වාසය සහ ලබාගතහැකි කාලය පිළිබඳ තනි සහ සාමූහික ඇගයීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම, ("යෝග්‍යතා මාර්ගෝපදේශය") මෙන්ම යෝග්‍යතා මාර්ගෝපදේශයේ, කළමනාකරණ මණ්ඩලයේ සහ අධීක්ෂණ මණ්ඩලයේ ව්‍යුහය, ප්‍රමාණය, සංයුතිය සහ කාර්යසාධනය සම්බන්ධයෙන් අවම වශයෙන් වසරකට වරක් පැවැත්විය යුතු නිරන්තර ඇගයීමේ ඵලදායිත්වය නියාමනය කිරීම සහ මේ සම්බන්ධයෙන් සාමූහිකව කළමනාකරණ මණ්ඩලයේ සහ අධීක්ෂණ මණ්ඩලයේ මෙන්ම අදාළ ආයතනවල සාමාජිකයින්ගේ දැනුම, කුසලතා සහ පළපුරුද්ද සම්බන්ධයෙන් අවම වශයෙන් වසරකට වරක් පැවැත්විය යුතු නිරන්තර ඇගයීම සම්බන්ධව අධීක්ෂණ මණ්ඩලය වෙත නිර්දේශ කිරීම, සහ යෝග්‍යතා මාර්ගෝපදේශයේ පිරිවිතරවලට අනුකූලව අනෙකුත් සියලු අවස්ථාවලදී කළමනාකරණ මණ්ඩලයේ සහ අධීක්ෂණ මණ්ඩලයේ මෙන්ම අදාළ ආයතනවල සාමාජිකයින්ගේ ඇගයීම, කළමනාකරණ මට්ටමෙන් පහළ පුද්ගලයින් තෝරා ගැනීම සහ පත්කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ මූලධර්ම පිළිබඳ සමාලෝචනය සහ අනෝන්‍ය වශයෙන් එකඟ වූ නාමයෝජනාවක් ඉදිරිපත් කිරීම තුළින් දෙවැනි හියෝජ්‍ය සභාපති තෝරා ගැනීම පිළිබඳ තිරණය සම්බන්ධව කළමනාකරණ මණ්ඩලයට සිදුකරනු ලබන නිර්දේශ සඳහන් කරයි.

විගණන කමිටුව

කමිටුවේ සාමාජිකයින් වන්නේ ෆ්‍රෑන්ක් විටර්, සභාපති (2022 ජූලි 28 සිට),සාමාජික (2022 ජූලි 28 දක්වා), මහාචාර්ය වෛද්‍ය නෝර්බට් වින්කෙල්ජොහාන්, සභාපති (2022 ජූලි 28 දක්වා) සාමාජික (2022 ජූලි 28 සිට) ආචාර්ය පෝල් ඇත්ලෙයිට්බර් (2022 මැයි 19 දක්වා), මන්ජා එයිෆර්ට් (2022 ජූලි 28 සිට) හෙන්රිට් මාර්ක් (2022 මාර්තු 31 දක්වා), ගාබ්‍රියෙල් ප්ලැටිචර්, ඩෙට්ලෙෆ් පොලස්චෙක්, බර්න්ඩ් රෝස්, ආචාර්ය ඩග්මර් වෙල්කර්ෂල්, ස්යෙගාන් වයිටෙල්, ආචාර්ය තියෝඩර් වෙයිමර්, ඇලෙක්සැන්ඩර් වයිනෙන්ඩ්ස් (2022 මැයි 19 සිට) ය.

අවදානම් කළමනාකරණ ක්‍රමයේ විශේෂයෙන් තිරසාරභාවය ආශ්‍රිත ගැටළු ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ අභ්‍යන්තර විගණන පද්ධතියේ ඵලදායිත්වය, මූල්‍ය ප්‍රකාශ විශේෂයෙන් විගණකවරයාගේ ස්වාධීනත්වය සහ විගණකවරයා විසින් සපයන ලද අමතර සේවා සම්බන්ධයෙන් විගණනය, සහ විශේෂයෙන් අවදානම් පාලනයේ දුර්වලතා, ප්‍රතිප